දවස් හයකින් දෙවියන් වහන්සේ හැම දෙයක්ම මවා නිම කළා. සත් වෙනි දවසට ආශීර්වාද කොට එය විවේක දවසක් කළා.



19

ඒදන් උයනේ ආදම් සහ ඒව: ආදම්ගේ බිරිඳ දෙවියන් වහන්සේට කීකරු වෙමින් සතුටින් සිටියා. දෙවියන් වහන්සේ ඔවුන්ගේ ස්වාමින් වහන්සේ, ඔවුන්ට සපයන්නා සහ හොඳම මිතුරා වූ සේක.



20

# සියල්ල දෙවියන් වහන්සේ මැවූ විට



සියල්ල දෙවියන් වහන්සේ මැවූ විට

දේව වචනයෙන් එක් කථාවක්

බයිබලයේ

උත්පත්ති 1-2

''ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ''
ගීතාවලිය 119:130


**ඉදිරිපත් කරන්නා** Edward Hughes
**නිදර්ශනය කරන්නා** Byron Unger; Lazarus

**අදහසක් වඩා සරල ස්වරූපයකින් ප්‍රකාශ කරන්නා**
**සකස්කරන්නා** Bob Davies; Tammy S.

Story ? of 60

**M1914.org**

**Bible for Children, PO Box 3, Winnipeg MB  R3C 2G1  Canada**



අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.


දෙවියන් වහන්සේ දන්නවා, අප වැරදි කර ඇති බව.
එම වැරදි උන් වහන්සේ පාපය ලෙස හඳුන්වන සේක.
පාපයේ කුලිය නම් මරණයයි.

උන් වහන්සේ ජීවමානව නැවත ස්වර්ගයට නැඟුණු නිසා
අපගේ පාප උන් වහන්සේට කමා කළ හැක. ඔබට පාපයෙන්
මිදීමට අවශ්‍ය නම් දෙවියන් වහන්සේට කියන්න.

ආදර දෙවි පියාණෙනි, ජේසුස් වහන්සේ මා වෙනුවෙන් මැරී
නැවත නැඟිටුණු බව මම විශ්වාස කරමි. මගේ ජීවිතයට පැමිණ
මගේ පව්වලට කමාව දුන මැනව. එවිට මට ඔබ වහන්සේ සමඟ
නව ජීවිතයක් ගත කළ හැක. සදාකාලයටම ඔබ සමඟ ඔබේ
දරුවකු ලෙස ජීවත්වීමට උදව් කළ මැනව. ආමෙන්.
ජොහන් 3:16

සැමදාම බයිබලය කියවමින් දෙවියන් වහන්සේට යාච්ඤා කරන්න.

සිංහල

Sinhalese

අපව මැව්වේ කවුද? බයිබලය සහ දේව වචනය මිනිස් ජාතියේ ආරම්භය කෙසේද කියා පවසයි. කලකට පෙර දෙවියන් වහන්සේ පළමු මනුෂ්‍යයා මවා ඔහුට ආදම් යැයි නම් තැබූ සේක.



1

දෙවියන් වහන්සේ, මනුෂ්‍යයා වන ආදම් පොළොවේ දූවිල්ලෙන් සෑදූ සේක. ඔහුට දෙවියන් වහන්සේ ජීවන හුස්ම හෙළූ සේක. එවිට මනුෂ්‍යයා ජීවමාන ප්‍රාණයක් විය. මෙම මනුෂ්‍යයා ඒදන් නම් ඉතා අලංකාර උයනක වාසය කළේය.



2

දෙවියන් වහන්සේ ආදම් මැවීමට පෙර ඉතා මනහර දෙයින් පිරුණු ලස්සන ලෝකයක් මවනු ලැබුවා.



3

පියවරෙන් පියවර කඳුවැටි ද, නිල් තණ බිම් ද, සුවඳ මල් ද, උස් ගස් කොළන් ද ලස්සන පියාපත් ඇති කුරුල්ලන් සහ හඬ නඟන මීමැස්සන් ද, දියේ සෙල්ලම් කරන තල්මසුන් සහ ලිස්සා යන ගොළුබෙල්ලන් ද මැවූ සේක.



4

පටන්ගැන්මෙහිදී දෙවියන් වහන්සේ කිසිවක් මැවීමට ප්‍රථම දෙවියන් වහන්සේ හැර කිසිවක් තිබුණේ නැත. මිනිස්සු, ස්ථාන, ද්‍රව්‍යයන් තිබුණේ නැත. කිසිවක් නැත. ආලෝකය හා අන්ධකාරය නොතිබිණි. ඉහළ දේ සහ පහළ දේ නොතිබිණි.



5

රැයේ හෝ හෙට දවසක් නොවීය. ආරම්භයක් නැත්තා වූ දෙවියන් වහන්සේ පමණක් සිටි සේක. පසුව උන් වහන්සේ ක්‍රියා කළ සේක. පටන්ගැන්මේදී දෙවියන් වහන්සේ අහසත් පොළොවත් මැවූ සේක.



6

පොළොව පාළුව, හිස්ව තිබුණා. ගැඹුර පිට අන්ධකාරය විය. එවිට දෙවියන් වහන්සේ කතාකර එළිය වේවා යි කී සේක.



7

ආලෝකය විය. දෙවියන් වහන්සේ ආලෝකයට දවාල කියා ද අන්ධකාරයට රාත්‍රිය කියා ද නම් තැබූ සේක. සවස ගතවිය. උදය උදාවිය. ඒ පළමු වන දවසය.



8

දෙවන දවසේ දෙවියන් වහන්සේ සාගරය, මුහුද, ඇළ දොල අහස යට පිළිවෙළින් රැස් කළ සේක. තුන් වන දවසේ ගොඩබිම මතු වේවා යි කී විට එලෙස විය.



9

දෙවියන් වහන්සේ නිල් තණකොළ, මල් වර්ග, පඳුරු සහ ගස්වැල් හට ගැනේවා යි වදාළ සේක. ඒවා ඇති විය, සවස ගතවිය. උදය උදාවිය. ඒ තුන් වන දවසය.



10

ඉන්පසු ඉරත් හඳත් ගණන් කළ නොහැකි තාරකාත් මැවූ සේක. ඒවා කිසිවකුට ගණන් කළ නොහැකි විය. සවස ගත විය. උදය උදා විය. එය සතර වන දවසයි.



11

මැවීමේ ලැයිස්තුවේ ඊළඟට වූයේ මුහුදු සතුන්, මාලුන් සහ කුරුල්ලන්යඃ පස්වෙනි දවසේ දෙවියන් වහන්සේ ලොකු මාලු, පොඩි මාලු, දිග පාද සහිත කොක්කු සහ ලස්සනට සිංදු කියන කුරුල්ලන් ඇති වන්නට සැලසූ සේක.



12

දිය පිරී ඇති තැන් අලංකාර කරන්නට ලොකු මාලුන් සහ පොඩි මාලුන් ද ගොඩබිම සහ අහස අලංකාර කරන්නට සතුට ඇති කරන්නට ලස්සන කුරුල්ලන් මැවූ සේක. සවස ගත විය. උදය උදා විය. ඒ පස් වන දවසයි.



13

ඉන්පසු දෙවියන් වහන්සේ නැවත කතා කළ සේක, කෘමි සත්තු, බඩ ගා යන සත්තු පණ ඇති සෑම වර්ගයේම සත්තු බිහි විය. එම සතුන් ප්‍රාණවත්ව ආහ. පොළොව දෙදරන තරමට අලි ඇතුන් සිම්පංචීන් රයිනෝසිරස් ඇතුළු විශාල සතුන්, දඟකාර වඳුරන්, හැඩිදැඩි කිඹුලන්, පණුවන්, කපටි රිළවුන්, ගාම්භීර පිරාෆ්,

ලස්සන පූසන් ආදි හැම වර්ගයකම සතුන් එදින මැව්වා.



14

හය වෙනි දවසේ තවත් විශේෂ දෙයක් කළා. දැන් උන් වහන්සේ හැම දෙයක්ම සූදානම් කරල තිබුණේ මනුෂ්‍යයාටයි. මිනිසාට ප්‍රයෝජනවත් නොයෙකුත් පලාවර්ග ආහාර වර්ග පොළොවෙන් හට ගන්නට සැලැස්වූ සේක. මිනිසාට සේවය කරන්නට ප්‍රයෝජනය පිණිස නොයෙකුත් සතුන් සිටියා.



15

දෙවියන් වහන්සේ වදාළ සේක. දෙවියන් වහන්සේගේ ස්වරූපයෙන් මිනිසා මැවූ සේක. පොළොවේ සිටින හැම සත්ත්වයාටම වැඩිය උසස් ලෙස මිනිසා මැවූ සේක. දෙවියන් වහන්සේගේ ස්වරූපයෙන් මිනිසා මැවූ සේක ...



16

දෙවියන් වහන්සේ වදාළ සේක. ''මිනිසා තනිව විසීම හොඳ නැත. ඔහුට උදව්කරන්න කෙනෙකු සිටිය යුතුයි.'' උන් වහන්සේ මැවූ සතුන් සියල්ලම ආදම් ළඟට ගෙන ආ සේක.



17

ආදම් ඒ සතුන් සියල්ලන්ටම නම් තැබුවා. එම සතුන්ට කෙතරම් දක්‍ෂතා තිබුණත් මිනිසාට සුදුසු සහකාරියක් ඒ එක සතකු අතර වත් සිටියේ නැහැ.



18